**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2025.05.26 |

කේ.එම්.ආර්.එස්.පී.බණ්ඩාර මයා,
අංක. 175/63බී, පට්ටියකැලේවත්ත,
තැන්නේකුඹුර,
මහනුවර.

**පැමිණිලිකාර පාර්ශවය**

01. විදුහල්පති,
මහ/ධර්මරාජ විද්‍යාලය, මහනුවර.

02. කේ.කේ.පී. ආරියසිංහ මයා
සභාපති - සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය
විදුහල්පති (හිටපු), මහ/ධර්මරාජ විද්‍යාලය, මහනුවර.
(වර්තමාන සේවා ස්ථානය : අධ්‍යාපන අමාත්‍යාංශය)

03. එච්. එම්. එස්. පී. හේරත් මිය
ලේකම් - සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය
මහ/ධර්මරාජ විද්‍යාලය, මහනුවර.

04. ඊ. එච්. එම්. ජී. ඩී. එස්. සමරකෝන් මිය
සභාපති - අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය,
විදුහල්පති, පුෂ්පදාන බාලිකා විද්‍යාලය, මහනුවර.

05. එස්. ජයතිස්ස මයා
ලේකම් - අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය,
සහකාර විදුහල්පති, මහ/ධර්මරාජ විද්‍යාලය, මහනුවර.

**වගඋත්තරකාර පාර්ශවය**

**<u>පැමිණිලි අංකය : HRC/KND/10/25/A</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

ඉහත නම් සඳහන් පැමිණිලිකාර පාර්ශවය විසින් 2024.12.30 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2025 වර්ෂයේ තම දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 1 ශ්‍රේණියට ඇතුළත් කිරීමට අදාළව අයදුම්පතක් යොමු කරන ලද බවත්, ඒ අනුව 2024.09.24 දින ඊට අදාළ සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වූ බවත් ය. ඉන්පසුව


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04.<br>இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04.<br>No. 14, R.A.De Mel Mawatha, Colombo -04. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011- 2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011- 2505541/74 |
| ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrcsl@gmail.com | | | | |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 /82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011- 2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 |
| වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk | | | | |

2024.10.24 වන දින ප.ව. 12.10ට පමණ මහනුවර ධර්මරාජ විද්‍යාලයෙන් දුරකථන ඇමතුමක් ලබා දී තමාගේ නිවස පරීක්ෂා කිරීමට පැමිණෙන බව පැවසූ බවත්, එදින රාජකාරි දිනයක් වූ බැවින් ගුරුවරියක වන තම බිරිඳ සහ මහනුවර මහ රෝහලේ අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස සේවය කරන තමා රාජකාරී ස්ථානවල සිටි බවත්, එසේ හෙයින් කෙටි නිවාඩුවක් ලබාගෙන තමා නිවසට පැමිණි බවත් පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් දක්වා ඇත.

එසේම, නිවස පරීක්ෂා කිරීමට පැමිණි නිලධාරීන්හට නිවස සොයා ගැනීමට අපහසු වූ බැවින් තමා එම සාමාජිකයින් නිවසට රැගෙන ආ බවත්, ඒ අවස්ථාවේදී එලෙස පැමිණි එක් නිලධාරියෙකු විසින් ගූගල් සිතියම පරීක්ෂා කර බලා තව පාසලක් සඳහා ලකුණු 05ක් අඩු කළයුතු බව පවසා සම්මුඛ පරීක්ෂණයේදි ලබාදුන් ලකුණු පත්‍රයේ ලකුණු 5 ක් අඩුකර මුළු ලකුණු 80 ක් ලෙස ලබාදුන් බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත. කෙසේ වුවද, 2025 වර්ෂයේ මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 1 ශ්‍රේණියට ඇතුළත් කිරීමට අදාළ තාවකාලික නාම ලේඛණය ප්‍රදර්ශනය කළ පසු තම දරුවාගේ නම එහි සඳහන් නොවීම මත අභියාචනා මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ බව ද පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

තවද, 2024.11.24 වන දින සිට පැවති අධික වර්ෂාව හේතුවෙන් තම නිවසට ඉහළ නිවසත් ගමන් කරන මාර්ගයත් නාය යාම හේතුවෙන් සහ සියළුම ජලනල පද්ධතීන් විනාශ වීම හේතුවෙන් ග්‍රාම නිලධාරි පැමිණ තම නිවසෙන් ඉවත්වන ලෙසට දැනුම් දුන් බවත්, එහෙත් තමා පදිංචියෙන් ඉවත් නොවී තම බිරිඳ සහ දරුවා පමණක් බිරිඳගේ මවගේ නිවසේ රැඳවූ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. එසේම, 2024.12.11 වන දින අභියාචනා පරීක්ෂණ මණ්ඩලයෙන් තමාට දුරකථන ඇමතුමක් ලබා දී ඔවුන් නිවස පරීක්ෂා කිරීමට පැමිණි බවත්, එය පරීක්ෂා කළ බවත්, තමා නිවසේ නොසිටි බව ප්‍රකාශ කළ බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, 2024.12.12 වන දින පැවැති අභියාචනා පරීක්ෂණයේදි සභාපතිතුමිය විසින් සියළු කරුණු සලකා බලා නැවතත් නිවස පරීක්ෂා කිරීමට අවශ්‍ය බව දන්වා සිටි නමුත්, ඔවුන් නැවත පරීක්ෂාවකට නොපැමිණි බවත්, අපදා තත්ත්වයන් හේතුවෙන් නිවසෙන් ඉවත් වූ හේතුව හැර වෙනත් හේතුවක් නොමැති බව තරයේ ප්‍රකාශ කරන බවත්, ඒ පිළිබඳව මහනුවර ධර්මරාජ විද්‍යාලය වෙත දැනුම් දුන්නද ඊට කිසිඳු පිළිසරණක් තමාට නොලැබුණු බවත්, ඒ අනුව තමාගේ දරුවාගේ නම පොරොත්තු ලේඛණයේ හෝ කිසිඳු ලේඛණයකට ඇතුලත් නොවීමෙන් තමන්ට දැඩි අසාධාරණයක් සිදුවූ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. එසේ හෙයින් මේ පිළිබඳ විමසා බලා සාධාරණයක් ඉටුකරදෙන ලෙස පැමිණිලිකාර පාර්ශවය විසින් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

පැමිණිල්ලට අදාළව 1 වන වගඋත්තරකරු වන මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති විසින් 2025.01.30 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් කියාසිටින්නේ, 2025 පළමු

වසරට සිසුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති හා ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති ලෙස කටයුතු කළ කේ. කේ. පී. ආරියසිංහ මහතා මේ වන විට උසස්වීමක් ලැබ අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ භාරගෙන ඇති බැවින් ධර්මරාජ විද්‍යාලයේ රාජකාරී ආවරණය කරන විදුහල්පති ලෙස එකී වාර්තාව ඉදිරිපත් කරන බවයි. එම වාර්තාව අනුව මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු RS 136 අංකය යටතේ 2025 පළමු වසරට සිසුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති බවත්, සම්මුඛ පරීක්ෂණයෙන් පසු 2024.10.24 දින නිවාස පරීක්ෂාව සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙක් සහභාගි වී ඇති බවත්, ලබාදී තිබූ ලිපිනය අනුව නිවස සොයා ගැනිමට අපහසු වූ බැවින් දුරකථන ඇමතුමක් මගින් පැමිණිලිකරු සම්බන්ධ කරගනිමින් මාර්ගය විමසා ඇති බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

එහිදී පැමිණිලිකරු විසින් පැවසූ මාර්ගයේ නිවස සොයා ගිය නමුත්, එම මාර්ගය දුෂ්කර හා දීර්ඝ මාර්ගයක් වූ බැවින් ඊට අමතරව නිවසට යාමට වෙනත් පහසු මාර්ගයක් ඇති බව සොයා ගන්නා ලද බවත්, පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණ සාමාජිකයින් ඒමට පෙර සේවා ස්ථානයේ සිට පෙර කී පහසු මාර්ගය භාවිත කර නිවසට පැමිණ දොර ජනෙල් විවෘත කර තිබූ බවත්, ඔහු විසින් නිරීක්ෂණ සාමාජිකයින් නිවස කරා රැගෙන ගිය බවට පැමිණිල්ලේ සඳහන් කරන ලද කරුණු අසත්‍ය බවත් 1 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

එසේම, තාවකාලික නාම ලේඛණය 2024.10.30 වන දින ප්‍රදර්ශනය කරන ලද බවත්, පැමිණිලිකරු කඩඉම් ලකුණු සපුරා තිබුණ ද, ඔහුගේ නම එම ලේඛණයට ඇතුලත් නොවූයේ ස්ථාන පරීක්ෂාවේදි පදිංචිය තහවුරු නොවීම නිසා බවත්, එහිදී පහත කරුණු සලකා බැලූ බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

i. එම නිවසේ දරුවෙකු හෝ කිසිවෙකු පදිංචිව සිටින බවක් නොපෙණුනු බවත්, දරුවෙකු භාවිතා කරන ඇඳුම්, සෙරෙප්පු සපත්තු, සෙල්ලම් බඩු ආදි කිසිවක් එහි නොතිබුණු බවත්, එමෙන්ම දීර්ඝ කාලයක් පදිංචිව නොසිටීම නිසා ඇති වන පුස් ගඳක් නිවසෙන් වහනය වූ බවත්,

ii. අසල්වැසි නිවෙස්වලින් පවසා ඇත්තේ අයදුම්කරු මෙම නිවසේ පදිංචිව නොසිටින අතර, ඉඳහිට වයසක කාන්තාවක් පැමිණෙන බවත්,

iii. පැමිණිලිකරු පැවසූ දීර්ඝ මාර්ගයේ නිවස සොයා යන අතරතුර හමුවූ නිවෙස්වලින් විමසීමේදි, "පිටින් ඇවිත් බදු ඔප්පු ලියාගෙන පදිංචි වෙලා ඉන්නෙත් නැති මිනිස්සුන්ගේ ළමයි ඔය ඉස්කෝලෙට දානකොට ගමේ ඉපදිච්ච අපේ ළමයි වෙනත් ඉස්කෝලවලට යනවා" යනුවෙන් එක් පුද්ගලයෙක් පවසා ඇති බවත්,

එම කරුණු අනුව අයදුම්කරු අදාල ලිපිනයේ පදිංචි බවට තහවුරු නොවූ බැවින් තාවකාලික ලේඛණයට නම ඇතුලත් නොකරන ලද බවත් 1 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

පැමිණිලිකරු පවසන පරිදි 2024.12.11 වන දින අභියාචනා හා විරෝධතා මණ්ඩල සාමාජිකයින් විසින් නැවත නිවස පරික්ෂාවක් සිදුකරන ලද බවත්, එදින කේ.ජී. නිලන්ති විශාඛා නම් වයස අවු.60 ක් පමණ පෙනුමැති කාන්තාවක් නිවසේ සිට ඇති බවත්, තමා නත්තරන්පොත පදිංචිව සිටින බවත්, මෙම නිවස කුලියට දී ඇති බවත්, ජලය නොමැති නිසා කුලියට ලබාගත් අය නිවසේ පදිංචිව නොසිටින බවත් එකී කේ.ජී.නිලන්ති විශාඛා නම් කාන්තාව පවසා ඇති බවත්, අභියාචනා මණ්ඩලයේ සාමාජිකයින්හට පැමිණිලිකරුගේ නිවසේ කිසිවකු පදිංචි නොමැති බවට ඒ අවට නිවස්වල අය ද පවසා ඇති බවත් 1 වන වගඋත්තරකරු සිය වාර්තාවේ සඳහන් කර ඇත.

තවද, එලෙස තොරතුරු ලබා දුන් අවට නිවෙස්වල අය හට ජලය තිබෙන බව පැවසූ බවත්, ජලය නොමැතිව සිටිය නොහැකි නිසා ඔවුන් කැඩුණු ජලනල ප්‍රතිසංස්කරණය කරගත් බව පවසා ඇති බවත්, ඒ අනුව පැමිණිලිකරුගේ නිවසේ කිසිවෙකු නොමැති බැවින් තවමත් ජලනල ප්‍රතිසංස්කරණය කර නොමැති බවට අභියාචනා මණ්ඩල සාමාජිකයින්ට තහවුරු වී ඇති බවත් 1 වන වගඋත්තරකරු සිය වාර්තාව තුළින් දක්වා ඇත.

පැමිණිලිකරු දක්වා ඇති ආකාරයට ග්‍රාම නිලධාරි විසින් නිවසින් ඉවත්වන ලෙස දැනුම්දුන් බවට වන ලේඛනයක් පිළිබඳව අභියාචනා මණ්ඩලය දැනුවත් කර නොමැති බවත්, ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් යොදා ඇති කිසිදු ලේඛනයක් හෝ ප්‍රකාශයක් අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කර නොමැති බවත්, එසේ ඉදිරිපත් කළ ද, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් නොකළ කිසිදු ලේඛනයක් අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැති බවත් 1 වන වගඋත්තරකරු සිය වාර්තාව තුළින් ප්‍රකාශ කර ඇත.

තවද, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයෙන් පසු අභියාචනා මණ්ඩල එකඟතාව මත තවදුරටත් ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය නොවන බව තීරණය වී ඇති බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය සාධාරණ බව අභියාචනා මණ්ඩලය විසින් සනාථ කර ඇති බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ**

පැමිණිලිකරු, තම දරුවා වන කේ.එම්.එස්.බණ්ඩාර යන අයව 2025 වර්ෂයේදී මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්කර ඇති බවත්, කැඳවුම් අංක RS 136 යටතේ 2024.09.24 වන දින ඊට අදාළ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 85ක් ලබාගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

එසේම, වගඋත්තරකාර මහනුවර ධර්මරාජ විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් විසින් පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු කර ගැනීමේ ස්ථාන පරීක්ෂණය සඳහා 2024.10.24 වන දින ප.ව. 12.15 ට පමණ පැමිණිලිකරුගේ නිවස වෙත පැමිණ ඇති බවත්, එම අවස්ථාවේදී පැමිණිලිකරු සිය සේවා ස්ථානයේ සිට නිවස වෙත පැමිණ සිට ඇති බවත්, ස්ථාන පරීක්ෂණය සඳහා පැමිණි නිලධාරීන් විසින් ගූගල් සිතියම් පරීක්ෂාවක් සිදු කර ඇති බවත්, එහිදී සිතියම නැවත ඇඳීමේ දී මුල් අවස්ථාවේදී නිරීක්ෂණය වූ පාසලට අමතරව තවත් එක් පාසලක් පැමිණිලිකරුගේ නිවස ආසන්නයේ ඇති බවට නිරීක්ෂණය වීම හේතුවෙන් ඒ සඳහා ද ලකුණු 05ක් අඩු කර සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකරු වෙත ලබා දී තිබූ ලකුණු ලේඛනයේ මුළු ලකුණු සංඛ්‍යාව ලකුණු 85 නොව 80 ලෙස සංශෝධනය කර ඇති බවත් පෙනී යයි.

තවද, 2024.10.30 වන දින 2025 වර්ෂයේදී මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා වන තාවකාලික නාම ලේඛනය ප්‍රදර්ශනය කර ඇති බවත්, එහි පැමිණිලිකරුගේ දරුවාගේ නම ඇතුළත් නොවූ බැවින් ඔහු විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය වේ. එලෙස නම ඇතුළත් නොවීමට හේතු වී ඇත්තේ 2024.10.24 වන දින සිදු කළ ස්ථානීය පරීක්ෂණයේ දී පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු නොවීම බව 1 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද 2025.01.30 දිනැති සිය වාර්තාව තුළින් දක්වා ඇති අතර, එම ස්ථානීය පරීක්ෂණය සඳහා සහභාගී වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කළ 3 වන වගඋත්තරකරිය විසින් ද පැමිණිලිකරුගේ ස්ථිර පදිංචියක් එකී නිවසෙහි ඇති බවට නිවසේ වටපිටාව සහ නිවස තුළ සිදු කළ පරීක්ෂාවෙන් තහවුරු නොවන බවට සටහන් යොදා ඇති බවත් නිරීක්ෂණය වේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කළ 2 වන වගඋත්තරකරු විසින් ද ඒ බව සනාථ කරමින් සටහන් යොදා ඇති බව ද අදාළ ලේඛන පරීක්ෂා කිරීමේ දී පෙනී යයි.

1 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2025.01.30 දිනැති වාර්තාවේ පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු නොවීම සම්බන්ධයෙන් සැලකිල්ලට ගනු ලැබූ කරුණු තුනක් දක්වා ඇති අතර, එහි අංක (i) වන කරුණ ලෙස දක්වා ඇත්තේ අදාල නිවසේ දරුවෙකු හෝ කිසිවෙකු පදිංචිව සිටින බවක් නොපෙණුන බවත්, දරුවෙකු භාවිතා කරන ඇඳුම්, සෙරෙප්පු සපත්තු හෝ සෙල්ලම් බඩුවක් යනාදි කිසිදු භාණ්ඩයක් නොතිබූ බවත්, අදාල නිවසේ දීර්ඝ කාලයක් පදිංචිව නොසිටීම නිසා ඇතිවන පුස් ගඳක් නිවසෙන් වහනය වූ බවත් ය. එලෙස පැමිණිලිකරුගේ නිවසේ දීර්ඝ කාලයක් පදිංචිව නොසිටීම නිසා ඇතිවන පුස් ගඳක් නිවසෙන් වාහනය වූ බවට 1 වන වගඋත්තරකරු සිය වාර්තාව තුළින් දක්වා තිබුණ ද, ස්ථානීය පරීක්ෂාව සඳහා සහභාගී වූ 3 වන වගඋත්තරකාරිය විසින් එවැනි කරුණක් සිය ස්ථානීය පරීක්ෂාවට අදාළ සටහන් තුළ දක්වා නොමැති බවද කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත්, වගඋත්තරකාර පාර්ශවය විසින් අදාල නිවසේ ඇතුළත නිරූපණය කරන ඡායාරූප කිහිපයක් ඉදිරිපත් කර ඇති අතර, 2025.02.17 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති

පරීක්ෂණයේදී ද දුරකථනයේ තිබූ එම ඡායාරූප ඉදිරිපත් කරන ලද නමුත්, එම ඡායාරූප අපැහැදිලි තත්ත්වයෙන් පැවතීම නිසා නිවසේ පවතින භාණ්ඩ කිහිපයක් දිස්වුණ ද එම නිවසේ කිසිවෙකු පදිංචිව සිටී ද නැද්ද යන්න තහවුරු කිරීමට එම ඡායාරූප අදාළ කරගැනීමේ හැකියාවක් නොපවතින බව පෙනී යයි.

තවද, ඉහත කී 1 වන වගඋත්තරකරුගේ වාර්තාවේ කරුණු තුන අතරින් (ii) සහ (iii) මගින් දක්වා ඇත්තේ ස්ථාන පරීක්ෂාවේදි පැමිණිලිකරුගේ නිවස අසල පදිංචිකරුවන් විසින් පැමිණිලිකරු අදාළ නිවසේ පදිංචි නොමැති බවට ප්‍රකාශ කර ඇති බවයි. ස්ථානීය පරීක්ෂණය සඳහා සහභාගී වූ 3 වන වගඋත්තරකාරිය වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම්වරිය විසින් ද ස්ථානීය පරීක්ෂණයට අදාළව සටහන් යෙදීමේ දී එකී කරුණ සටහන් කර තිබුණ ද එම තොරතුරු ලබා දුන් පැමිණිලිකරුගේ නිවස අසල පදිංචිකරුවන් කවුරුන් ද යන්න නිශ්චිතව සඳහන් කර නොමැති බව එම ලේඛන පරීක්ෂා කර බැලීමේ දී නිරීක්ෂණය වේ.

1 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2025.01.30 දිනැති වාර්තාවේ දක්වා ඇත්තේ 2024.12.11 වන දින අභියාචනා හා විරෝධතා මණ්ඩල සාමාජිකයින් විසින් නැවත පැමිණිලිකරුගේ නිවස පරීක්ෂා කළ බවත්, එම අවස්ථාවේ කේ.ජී.නිලන්ති විශාඛා යන වයස අවු 60 ක පමණ කාන්තාවක් නිවසේ සිටි බවත්, තමා නත්තරන්පොත ප්‍රදේශයේ පදිංචිව සිටින බවත්, අදාළ නිවස කුලියට දී ඇති බවත්, ජලය නොමැති නිසා කුලියට ලබාගත් අය නිවසේ පදිංචිව නොසිටින බවත් එම කාන්තාව විසින් ප්‍රකාශ කළ බවත් ය.

එමෙන්ම, අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කළ 5 වන වගඋත්තරකරු විසින් 2025.02.17 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී ප්‍රකාශ කර ඇත්තේ 2024.12.11 වන දින ප.ව. 2.45ට පමණ තමා තවත් නිලධාරීන් දෙදෙනෙකු සමඟ පැමිණිලිකරුගේ නිවස පරීක්ෂා කිරීමට ගිය අවස්ථාවේදී පැමිණිලිකරු නිවසේ නොසිටි බවත්, නිවසේ අයිතිකාරිය පමණක් එහි සිටි බවත්, ඇය නත්තරන්පොත ප්‍රදේශයේ පදිංචිව සිටින අතර, එම නිවසට පැමිණ යාමට පමණක් පැමිණි බවට ප්‍රකාශ කළ බවත් ය. එසේම, අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කළ 4 වන වගඋත්තරකාරිය විසින් අදාළ ලකුණු ලේඛනයේ සටහන් කර ඇත්තේ ද ස්ථානීය පරීක්ෂණය පිළිබඳව සෑහීමකට පත් නොවූ බැවින් ලකුණු ලබා දීම නතර කරන ලද බවයි.

ඒ අනුව 2024.10.24 සහ 2024.12.11 යන දෙදින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණයන්හි දී පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු නොවීම නිසා පැමිණිලිකරුගේ දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 2025 වර්ෂය සඳහා 1 වන ශ්‍රේණියට ඇතුළත් කරගැනීමට වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ.

2024.10.24 වන දින ස්ථානීය පරීක්ෂණය සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් පැමිණි අවස්ථාවේ දී පැමිණිලිකරු නිවසෙහි සිට ඇති නමුත්, 2024.12.11 වන දින ස්ථානීය පරීක්ෂණය

සඳහා අභියාචන මණ්ඩලයේ නිලධාරීන් පැමිණි අවස්ථාවේ දී පැමිණිලිකරු බදු පදනමින් වාසය කරන නිවසේ හිමිකරුගේ බිරිඳ නිවසට පැමිණ සිට ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ 2024.11.24 වන දින සිට පැවති අධික වර්ෂාව හේතුවෙන් ඔවුන්ගේ නිවසට ඉහළ නිවස සහ ඔවුන් ගමන් කරන මාර්ගය නාය යාමකට ලක්වීම හේතුවෙන් ග්‍රාම නිලධාරී විසින් නිවසින් ඉවත් වන ලෙසට දැනුම් දුන් බවත්, ඒ අනුව පැමිණිලිකරු පදිංචියෙන් ඉවත් නොවී බිරිඳ සහ දරුවන් පමණක් බිරිඳගේ මවගේ නිවසේ රැඳවූ බවත් ය. එලෙස පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් නිවසේ ජල නල පද්ධතිය විනාශ වී තිබූ බවත්, 2024.12.11 වන දින ස්ථානීය පරීක්ෂණය සඳහා නිලධාරීන් පැමිණෙන විට එකී ජලනල පද්ධතියට සිදුව ඇති විනාශය පරීක්ෂා කිරීමට නිවසේ හිමිකරුගේ බිරිඳ පැමිණ සිට ඇති බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

එසේම, පැමිණිලිකරු පදිංචි නිවස අයත් අංක 275 තැන්නේකුඹුර වසමේ ග්‍රාම නිලධාරී විසින් මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් මගින් මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත 2024.12.31 දිනැති ලිපියක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු ඔහුගේ බිරිඳ සහ දරුවන් දෙදෙනා සමඟ අදාළ නිවසේ පදිංචිව සිටින බවත්, 2024.11.25 වන දින සිට ඇති වූ නායයාම් අවදානම හේතුවෙන් එකී නිවසින් ඉවත්වන ලෙසට පැමිණිලිකරු වෙත දැනුම් දී තිබූ බවත් ය.

එමෙන්ම, අභියාචන මණ්ඩලයේ නිලධාරීන් පැමිණිලිකරුගේ නිවස පරීක්ෂා කිරීමට පැමිණි අවස්ථාවේදී එකී නිවසේ සිටි බවට සඳහන් කර ඇති කේ.ජී. නිලන්ති විශාකා යන අය විසින් 2025.05.17 වන දින කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශයක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, ඇයගේ ස්වාමි පුරුෂයා වන සුනිල් රණවීර යන අය විසින් අදාළ නිවස පැමිණිලිකරු හට බදු පදනම මත ලබා දී ඇති බවත්, එකී නිවස ඇතුළු ප්‍රදේශයේ පැවති අධික වර්ෂාවක් හේතුවෙන් තමා එම නිවසේ ජලනල පද්ධතියට සිදු වී ඇති හානිය පරීක්ෂා කිරීමට එහි ගිය අවස්ථාවේදී පැමිණිලිකරුගේ දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලය වෙත ඇතුළත් කිරීමට අදාළව පරීක්ෂා කිරීමට පැමිණි අභියාචනා මණ්ඩල නිලධාරීන් හමුවූ බවත්, එම නිලධාරීන් හට එම නිවස පැමිණිලිකරුට බදු දී ඇති බැවින් ඔහු ඇතුළු පවුලේ අය එම නිවසේ පදිංචිව සිටින බව පැවසූ බවත්, නිවසේ ජලනල පද්ධතියට හානි වීම හේතුවෙන් ඔවුන් අසල්වැසි නිවසකින් ජලය ලබාගෙන ජීවත් වන බව ද පැවසූ නමුත්, මහනුවර ධර්මරාජ විද්‍යාලය විසින් යොමු කර ඇති වාර්තාවේ එකී කරුණු වරදවා දක්වා ඇති බවත් ය.

ඉහත කී ග්‍රාම නිලධාරීගේ ලිපිය අනුව ද 2024.11.25 වන දින සිට පැමිණිලිකරු පදිංචි ප්‍රදේශයේ නායයාම් අවදානමක් තිබූ බවින් නිවසින් ඉවත් වන ලෙසට දන්වා තිබූ බවට දක්වා ඇති බැවින්, 2024.12.11 වන දින අභියාචනා මණ්ඩල නිලධාරීන් පැමිණි අවස්ථාවේදී පැමිණිලිකරු බදු පදනමින් ලබාගෙන ඇති නිවසේ හිමිකරුගේ බිරිඳ එකී නිවසට පැමිණ සිට ඇත්තේ අයහපත්

කාලගුණික තත්ත්වය හේතුවෙන් ජලනල පද්ධතියට සිදු වූ හානිය පරීක්ෂා කිරීමට බවට සිදු කර ඇති ප්‍රකාශය පිළිගැනීමට හැකියාවක් ඇති බව පෙනී යයි.

තවද, 1 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව මගින් දන්වා ඇත්තේ පැමිණිලිකරුගේ අවට නිවැසියන්ගේ නිවාසවල ජලය තිබෙන බවත්, ජලය නොමැතිව සිටිය නොහැකි බැවින් කැඩුණු ජලනල ප්‍රතිසංස්කරණය කරගෙන ඇති බවත්, පැමිණිලි පාර්ශවය නිවසේ පදිංචි නොමැති බැවින් ජලනල ප්‍රතිසංස්කරණය කරගෙන නොමැති බවට අභියාචනා මණ්ඩලයට තහවුරු වී ඇති බවත් ය. එහෙත් පැමිණිලිකරු විසින් උක්ත කරුණට අදාළව විරෝධතා ඉදිරිපත් කරමින් කියා සිටින්නේ, එකී දිනවල පැවති දැඩි වර්ෂා තත්ත්වය හේතුවෙන් ජලනල පද්ධතිය බිඳවැටී තිබූ බවත්, අසල්වැසි නිවසකින් ජලය ලබාගත් බවට අසල්වැසියන් විසින් ලිඛිතව තහවුරු කර ඇති බවත් ය.

ඒ අනුව අංක 175/62, පට්ටියකැලේ වත්ත, තැන්නේකුඹුර ලිපිනයේ පදිංචි කැලැකෝරළේ ගෙදර රුක්මල් කුමාරි රණසිංහ යන අය විසින් 2025.05.17 දිනැතිව කොමිෂන් සභාව වෙත දිව්රුම් ප්‍රකාශයක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, 175/63 බී, පට්ටියකැලේවත්ත, තැන්නේකුඹුර යන ලිපිනයේ පැමිණිලිකරු හා ඔහුගේ පවුලේ අය බදු පදනම මත පදිංචිව සිටින බවත්, පැවති අධික වර්ෂාව නිසා පැමිණිලිකරුගේ නිවසට ජලය ලැබෙන ජලනල පද්ධතිය විනාශ වූ පසු ඇයගේ නිවසේ ළිඳෙන් පැමිණිලිකරු ජලය ලබාගත් බවත්, ජලය නොමැතිකම නිසා පැමිණිලිකරු ඇතුළු පවුලේ අය එකී නිවසේ පදිංචිව නොසිටි බවට කවුරු හෝ කියා සිටින්නේ නම් එය අසත්‍යයක් බවත්, වර්තමානයේ පවතින අධික වර්ෂාව නිසා මතුව ඇති නායයෑමේ තත්ත්වය මත වුවද පැමිණිලිකරු ඇතුළු පවුලේ අය එකී නිවසේ පදිංචිව සිටින බවත්, වසර 10කට අධික කාලයක් අසල්වැසියන් ලෙස ඔවුන් පදිංචිව සිටින බවත් ය. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරුගේ නිවසේ ජලය නොමැති වීම හේතුවෙන් පැමිණිලිකරු එහි පදිංචිව නොසිටින බවට තහවුරු වූ බවට සිදු කර ඇති ප්‍රකාශය සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් මතු වන බව කොමිෂන් සභාවට පෙනී යයි.

තවද, අංක 175/63, පට්ටියකැලේ වත්ත, තැන්නේකුඹුර ලිපිනයේ පදිංචි ගයානි ලංකා විතානගේ යන අය විසින් 2025.05.17 දිනැතිව දිනැතිව කොමිෂන් සභාව වෙත දිව්රුම් ප්‍රකාශයක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, 175/63 බී, පට්ටියකැලේවත්ත, තැන්නේකුඹුර යන ලිපිනයේ පැමිණිලිකරු අවුරුදු 10ක පමණ කාලයක් බදු පදනම මත ඔහුගේ බිරිඳ සහ දරු දෙදෙනා සමඟ ජීවත් වන බවත්, ඇය වසර 10කට අධික කාලයක සිට ඔවුන්ව අසල්වැසියන් ලෙස ඇසුරු කරන බවත් ය.

ඒ අනුව ඉහත කී කැලැකෝරළේ ගෙදර රුක්මල් කුමාරි රණසිංහ සහ ගයානි ලංකා විතානගේ යන පැමිණිලිකරුගේ අසල්වාසීන් දෙදෙනෙකු විසින් පැමිණිලිකරු අදාළ නිවසේ පදිංචිව සිටින බවට තහවුරු කරමින් ලබා දී ඇති දිව්රුම් ප්‍රකාශ අනුව සලකා බැලීමේ දී පැමිණිලිකරු ගේ නිවස අසල පදිංචිකරුවන් විසින් පැමිණිලිකරු එකී නිවසේ පදිංචි නොමැති බවට දැනුම් දුන් බවට 2 වන, 3 වන, 4 වන සහ 5 වන වගඋත්තරකරුවන් විසින් සිදු කර ඇති ප්‍රකාශ පිළිගැනීම ගැටලු සහගත වන බවද කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

තවද, මහනුවර දිස්ත්‍රික්කයේ තැන්නේකුඹුර උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපතිනිය ලෙස රාජකාරියේ නියුතු රණසිංහ මුදියන්සේලාගේ චම්පිකා නිරෝෂනි රණසිංහ යන අය විසින් 2025.05.17 දිනැතිව කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශයක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, 175/63 බී, පට්ටියකැලේවත්ත, තැන්නේකුඹුර යන ලිපිනයේ පදිංචි පැමිණිලිකරු ඔහුගේ බිරිඳ සහ දරු දෙදෙනා සමඟ අවුරුදු 10ක පමණ කාලයක සිට ඔවුන්ගේ ලිපි ගනුදෙනු කටයුතු ඇයගේ කාර්යාලය මගින් සිදු කරනු ලබන බවත්, පැමිණිලිකරුගේ සහ ඔහුගේ බිරිඳගේ නම් පට්ටියකැලේවත්ත ඡන්ද නාම ලේඛනයේ ඇතුළත්ව ඇති බවත් ය.

එසේම, පැමිණිලිකරු පදිංචිව සිටින බවට දක්වා ඇති 175/63 බී, පට්ටියකැලේ වත්ත, තැන්නේකුඹුර යන ලිපිනය යටතේ ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී ඇත්තේ පැමිණිලිකරු වන කේ.එම්.ආර්. එස්.පී.බණ්ඩාර සහ ඔහුගේ බිරිඳ වන මැදගෙදර මුදියන්සේලාගේ නයනි දිල්රුක්ෂි ශ්‍යාමා බණ්ඩාර යන දෙදෙනා පමණක් වන බව ද නිරීක්ෂණය වේ.

ඒ අනුව ඉහත කී අංක 275 තැන්නේකුඹුර වසමේ ග්‍රාම නිලධාරී විසින් මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් මගින් මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත යොමු කර ඇති 2024.12.31 දිනැති ලිපිය සහ තැන්නේකුඹුර උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපතිනිය, කේ.ජී. නිලන්ති විශාකා, කැලැකෝරළේ ගෙදර රුක්මල් කුමාරි රණසිංහ සහ ගයානි ලංකා විතානගේ යන අය විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති 2025.05.17 දිනැති දිවුරුම් ප්‍රකාශ මගින් පැමිණිලිකරු අදාළ නිවසේ පදිංචි බවට තහවුරු කර ඇති බැවින්, ස්ථානීය පරීක්ෂණයේ දී පැමිණිලිකරු අදාළ නිවසේ පදිංචිව සිටින බව තහවුරු නොවූ බවට 2 වන, 3 වන, 4 වන සහ 5 වන වගඋත්තරකරුවන් විසින් දක්වා ඇති කරුණු පිළිගැනීම සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් මතුවන බව ද කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් වශයෙන් ගෙන සලකා බැලීමේ දී පැමිණිලිකරු අදාළ ලිපිනයේ පදිංචිව සිටින බව රජයේ නිලධාරීන් දෙදෙනෙකු වන 275 තැන්නේකුඹුර වසමේ ග්‍රාම නිලධාරි සහ තැන්නේකුඹුර උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපතිනිය විසින් තහවුරු කර ඇති බවත්, පැමිණිලිකරුගේ නිවස ආසන්නයේ පදිංචි ඔහුගේ අසල්වැසියන් දෙදෙනෙකු විසින් ද වසර 10ක සිට පැමිණිලිකරු එකී ලිපිනයේ පදිංචිව සිටින බවට තහවුරු කරමින් කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශ ලබාදී ඇති බවත් නිරීක්ෂණය වන බැවින්, පැමිණිලිකරු 2025 වර්ෂයේ මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 1 ශ්‍රේණිය සඳහා ආසන්න පදිංචිකරුවන් ගණය යටතේ අයදුම්කර සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 80ක් ලබාගනිමින් කඩයිම් ලකුණු සීමාව වන ලකුණු 80ක ප්‍රමාණය ලබාගෙන තිබියදී, වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු නොවන බවට තීරණය කර පැමිණිලිකරුගේ දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ පළමු වසරට ඇතුලත් කර නොගැනීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර

ඇති නීතිය පසිඳලීම ද නීතිය ක්‍රියාත්මක කිරීම ද සෑම දෙනාටම එක හා සමාන විය යුතු බවට වන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

පැමිණිලිකරුගේ දරුවා 2025 වර්ෂයේ මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට ඇතුළත් කරගැනීමට 1 වන වගඋත්තරකරු විසින් කටයුතු කළ යුතු ය.

2025.06.26 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී .පුංචිහේවා,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - අවශ්‍ය පියවර ගැනීම සඳහා

03. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා